# අනවසර ඉදිකිරීමක් සඳහා ආවරණ අනුමැතිය ලබා ගැනීම.
# Obtaining cover approval for unauthorized construction.

පළාත් පාලන ආයතනයක් විසින් ලබාගත් ඉදිකිරීම් බලපත්‍රයක් නොමැතිව කරන ලද ඉදිකිරීම් අනවසර ඉදිකිරීම් වන අතර ඇතැම් අවස්ථාවල එවන් අනවසර ඉදිකිරීම් සඳහා ආවරණ අනුමැතිය ලබා ගත හැකිය. Construction done without a construction permit obtained by a local authority is unauthorized construction and in some cases, cover approval can be obtained for such unauthorized construction.

මේ එය සිදු කරන ආකාරයයි.
Here's how to do it.

**01**

මුලින්ම ඉල්ලුම්පත්‍රයක් ලබා ගන්න.පළාත් පාලන ආයතනයේ පෙරටු කාර්යාලයෙන් ලබාගත හැකියි. එසේම සභාවේ වෙබ් අඩවියෙන් ද බාගත කළ හැකිය.
**First get an application form. It can be obtained from the front office of the local government. It can also be downloaded from the website of the council.**

**02**

මෙම ඉල්ලුම්පත පැහැදිලිව සහ නිවැරදිව සම්පූර්ණ කරන්න.
**Complete this application clearly and accurately.**

**03**

සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත අදාල ලේඛන සමග පෙරටු කාර්යාලයට භාරදෙන්න.
Submit the completed application form along with the relevant documents to the front office.

**04**

ඒ සඳහා නියම කරන ගාස්තුව ගෙවා ලදුපතක් ලබාගන්න.
Pay the prescribed fee and get a receipt.

**05**

ඔබගේ ඉල්ලුම් පත මොහොතේම අදාළ තාක්ෂණ නිලධාරියා වෙත යොමු කරන අතර එය තමන්ට ලැබුණු විගස ක්ෂේත්‍ර පරීක්ෂණයට පැමිණෙන දිනය තහවුරු කරන නිවේදනය ඔබ වෙත ලබා දෙනවා.
**Your application will be immediately forwarded to the concerned Technical Officer and as soon as it is received, you will be notified confirming the date of the field visit.**

**06**

නියම කරගත් දිනයේ අදාල තාක්ෂණ නිල නිලධාරියා ක්ෂේත්‍ර පරීක්ෂාවට පැමිණෙන අතර ඉල්ලීම පිළිබඳ නිරීක්ෂණ සහ නිර්දේශ සහිත ලිපිගොනුව ඔහු විසින් ක්ෂේත්‍ර පරීක්ෂාව කළ දිනයේම සැලසුම් කමිටුවට ඉදිරිපත් කිරීම සඳහා අදාළ නිලධාරියා වෙත භාර දෙනවා.
On the appointed day, the concerned Technical Officer will come for the field inspection and hand over the file with observations and recommendations on the request to the concerned officer for submission to the Planning Committee on the same day of the field inspection.

**07**

තාක්ෂණ නිලධාරියාගේ නිර්දේශ සහිත ඉල්ලීම සලකා බලා අනුමත කිරීම නියම කරගත් කමිටු දිනයේ දී සිදු කරනු ලබනවා.
**The request with the recommendation of the Technical Officer will be considered and approved on the scheduled committee date.**

**08**

ආවරණ අනුමැතිය සඳහා ගෙවිය යුතු ප්‍රමාද ගාස්තුව නියම කර එය ගෙවන ලෙස සැලසුම් කමිටුව රැස්වූ දිනට පසු දින ඉල්ලුම්කරුට දැනුම් දෙනු ලබනවා.
**The applicant will be notified on the day after the meeting of the planning committee to fix the late fee for coverage approval and pay the same.**

**09**

ඉල්ලුම්කරු විසින් ප්‍රමාද ගාස්තු ගෙවූ වහාම විෂයභාර නිලධාරියා දැනුම්වත් කළ යුතුය.
The applicant should inform the subject officer immediately after paying the late fees.

**10**

බලපත්‍රයක් ලබා නොගෙන කරන ලද ඕනෑම ඉදිකිරීමක් අනවසර ඉදිකිරීමක් ලෙස සලකන අතර එය කඩා ඉවත් කරන ලෙස බලයලත් නිලධාරියා විසින් නියෝග කරනු ඇත.
Any construction without obtaining a permit will be considered as unauthorized construction and the authorized officer will order its demolition.